# විශ්වධරණී උපදේශක මණ්ඩලය (Vishwadharani Advisory Board)



## ප්‍රධාන උපදේශක: නීතීඥ චතුර උමගිලිය මහතා.

## Chief Advisor: Mr. Chatura Umagiliya, Attorney At Law.

ප්‍රකට නීතීඥවරයෙකු වන චතුර නිශාන් උමගිලිය මහතා ශ්‍රී ලංකා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (පරිපාලන) ලෙස දැනට සේවය කරන අතර ගණිත ගුරුවරයෙකු ලෙස වෘත්තීය දිවිය ආරම්භ කරන ලදී. සහකාර මැතිවරණ කොමසාරිස් වරයෙකු ලෙස ද රාජ්‍ය පරිපාලන අංශය තුළ සේවය කර ඇති නීතීඥ උමගිලිය මහතා  පෙර අපර දෙදිග අංක විද්‍යා ක්‍රමවේදයන් මනා ලෙස හදාරා එම විශයෙහි වූ තම පාරම්පරික උරුමයන් ද මුසු කරමින් ශ්‍රී ලංකාවට ආවේණික වූ අංක විද්‍යා ක්‍රමවේදයක් බිහි කර එය ක්‍රමවත්ව හා සංවිධානාත්මකව සමාජගත කිරීමේ පුරෝගාමී අංක විද්‍යා විශේෂඥවරයෙකි.

අංක විද්‍යා විශේෂඥ වරයෙකු ලෙස සමාජ මාධ්‍ය තුළ නමක් දිනා සිටින එතුමා, රටතුළ පවතින සමාජ දේශපාලන තත්වයන් සහ පුද්ගල චරිත පිළිබඳව ඉතා නිවැරදි අංක විද්‍යාත්මක විග්‍රහයන් ඉදිරිපත් කිරීමේ හා පුරෝකථනය කිරීමේ හැකියාව ඇති බුද්ධිමතෙකු ද වන අතර ඔහු ගේය පද රචකයෙකුද වේ. “නෙතුමාන” ඔහුගේම යූ ටියුබ් චැනලයයි.

Chatura Nishan Umagiliya, a well-known lawyer, currently works as the Deputy Director (Administration) of the Wildlife Conservation Department of Sri Lanka and started his career as a mathematics teacher. Mr. Umagiliya, has also worked as an Assistant Election Commissioner in the Public Administration Service and a pioneer numerology expert who studied western and Vedic numerology methods and blended his traditional heritage in that field to create a unique numerology method for Sri Lanka and socialize it in an orderly and organized manner.

He is a recognized numerologist and intellectual on social media, noted for his insightful analyses of socio-political issues and personalities, as well as his work as a lyricist. He hosts a YouTube channel named “Nethumana.”



## සහය උපදේශිකා: උචිතා කුරේ මහත්මිය

## Assistant Instructor: Mrs. Uchitha Cooray

ශ්‍රී ලංකා ගිණුම්කරණ ශිල්පී ආයතනයෙන් (AAT) සුදුසුකම් ලබා දිවයිනේ ප්‍රමුඛතම පෞද්ගලික ආයතනයක ගණකාධිකාරීවරියක වශයෙන් සේවය කර ඇති උචිතා මහත්මිය,“Chathura Umagiliya Numerology Academy “හී අංක විද්‍යාව හදාරා ඇති අතර අංක විද්‍යා විද්‍යාර්ථීන් ගේ සංසදයේ විධායක කමිටු සාමාජිකාවක් ද වන අතර හස්ථ රේඛා ශාස්ත්‍රය පිළිබඳව ද ප්‍රාමාණික විද්වතෙකි.

Ms. Uchitha, who has qualified from the Association of Accounting Technicians of Sri Lanka (AAT) and worked as an accountant in one of the leading private firms in the island, studied Numerology at "Chathura Umagiliya Numerology Academy" and is also an executive committee member of the Forum of Numerologists, is also an authentic scholar on Palmistry.

# විශ්වධරණී සංස්කාරක මණ්ඩලය (Vishwadharani Editorial Board)



## ප්‍රධාන සංස්කාරක: හරින්ද්‍රනාත් ඛේමින්ද මහතා
## Editor-in-Chief: Mr. Harindranath Kheminda

වෘත්තියෙන් සිවිල් ඉංජිනේරුවරයෙකු වන මොහු කැළණිය විශ්ව විද්‍යාලයෙන් වාස්තු විද්‍යාව හදාරා ඇති අතර ලොව සුප්‍රකට ඉන්දියානු පිරමීඩ් වාස්තු විද්‍යා විශේෂඥවරයෙකුද වේ. අධිතාක්ෂණික අධ්‍යාත්මික මෙවළම් පිළිබඳව ඉන්දියාවේ “ප්‍රෝයන්ත්‍ර” සමාගමේ බලය ලත් ශ්‍රී ලංකා නියෝජිතවරයා වන ඔහු ප්‍රවීණ රේකී සුව ශිල්පියෙකු ද වන අතර, අංක විද්‍යා විද්‍යාර්ථියෙකු ද වේ. වාස්තු විද්‍යා විශයයෙහි ප්‍රවීණ පුවත් පත් ලේඛකයෙකුද ලෙස ද කටයුතු කරයි.

A civil engineer, he studied Vaasthu science at the University of Kelaniya, Sri Lanka and is an expert in the discipline. He represents the Indian company "Proyanthra" in Sri Lanka, which specializes in high-tech spiritual devices. Additionally, he is a master Reiki healer, a numerologist, and a proficient writer on Vaasthu science for newspapers.



## උමේශ් අරවින්ද මහතා
## Mr.Umesh Aravinda

වෘත්තීය ඡායාරූප සංස්කරණ සහ ග්‍රැෆික් නිර්මාණකරුවෙකු වන උමේශ් අරවින්ද මහතා බහුමාධ්‍ය ඩිප්ලෝමාධාරියෙකි. Creative Album Design & Gleam Art Photography (Pvt) Ltd. හි හිමිකරු සහ ග්‍රැෆික් නිර්මාණකරු ද වන අතර අංක විද්‍යා විද්‍යාර්ථියෙකු මෙන්ම ජෝතිෂ්‍ය හා ගුප්ත විද්‍යා පර්යේෂකයෙකුද වේ.

Umesh Aravinda, a professional photo editor and graphic designer, who possess a diploma in multimedia and owns Creative Album Design & Gleam Art Photography (Pvt) Ltd. He is also a numerologist and a researcher in astrology and esotericism.



## ආචාර්ය ජී. ආර්. නිල්මිණි හිල්ඩා කුමාරි මහත්මිය.
## Dr. Mrs. G. R. Nilmini Hilda Kumari.

කැළණිය විශ්ව විද්‍යාලයේ ශාස්ත්‍රවේදී උපාධිධාරිණියෙකු වන ආචාර්ය නිල්මිණි මහත්මිය සම්මානලාභී ජෝතිෂ්‍යවේදිණියකි. කාව්‍ය රචනා කිරීමේ හා ලේඛන කලාවේ මනා දක්ෂතා දක්වන ඇය, අංක විද්‍යා විද්‍යාර්ථියෙකු ද වේ.

Dr. Nilmini is an award-winning astrologer who holds a Bachelor of Arts degree from the University of Kelaniya. She is also a Numerologist who is very talented in poetry and writing.



## ආර්. එම්. සේමසිරි බණ්ඩාර මහතා.
## Mr. R. M. Semasiri andara

ජාත්‍යන්තර බුඩෝකාන් කරාතේ සංවිධානයේ ශ්‍රී ලංකා නියෝජිතවරයා සහ කන්තෝ බුඩෝකාන් කරාතේ සංවිධානයේ ශ්‍රී ලංකා ප්‍රධාන උපදේශක සහ ශ්‍රේණිපරීක්ෂක වරයා වන අතර අංක විද්‍යා විද්‍යාර්ථියෙකු ද වේ.

Mr. Semasiri is the Sri Lanka representative of the International Budokan Karate Organization. He is also the Chief Instructor and grading examiner for Sri Lanka affiliated to the Kanto Budokan Karate Organization and is also a Numerologist.



## ශ්‍යාමිලා රාමචන්ද්‍රන් මහත්මිය:
## Ms. Shyamala Ramachandran:

පූර්ව ළමාවිය සංවර්ධනය කිරීමේ හා පරිවාස පෙර පාසල් ගුරුවරියක් ලෙස සේවය කොට ඇති රාමචන්ද්‍රන් මහත්මිය, ඉංග්‍රීසි, සිංහල හා දමිළ යන භාෂා ත්‍රිත්වයෙන්ම ඉගැන්වීම් සිදු කල ප්‍රාථමික පාසල් ගුරුවරියක ද වූ අතර විශේෂයෙන් මන්ද මානසික දරුවන් සහ වැඩිහිටියන් සඳහා උපදේශණ කටයුතු වල ද නියැලී ඇත. ඇය පූර්ණ කාලීන සමාජ සේවිකාවක් ලෙස ක්‍රියාකාරීව සිටින අතර, අංක විද්‍යා විද්‍යාර්ථියෙකු ද වේ.

Mrs. Ramachandran, who has worked as an early childhood development and probationary preschool teacher, was also a primary school teacher who taught in all three languages, English, Sinhala and Tamil, and also engaged in counseling activities especially for mentally challenged children and adults. She is active as a full-time social worker, and is also a numerologist.



## චින්තක සංජීව රාමනායක මහතා
## Mr. Chinthaka Sanjeewa Ramanayaka

ප්‍රවීණ ජෝතිර්වේදියෙකු, හස්ථ රේඛා ඩිප්ලෝමාධාරියෙකු, තත්කාල හා වාස්තුවේදීයෙකු සහ රාජ්‍ය අංශයේ විශ්‍රාමික ලිපිකරුවෙකු වශයෙන් හසළ පළපුරුද්දක් ඇති චින්තක මහතා අංක විද්‍යා විද්‍යාර්ථියෙකු ලෙසද කටයුතු කරයි.

Mr. Ramanayaka, is a veteran astrologer and Palmistry Diploma holder as well as a Thathkala and vaasthu expert.  He is also a retired government servant in Clerical service and a numerologist.



## ප්‍රසන්න මාතර ආරච්චි මහතා

## Mr. Prasanna Mathara Arachchi

යෝගා සහ ව්‍යුහ විද්‍යාව පිළිබඳව ඩිප්ලෝමාධාරියෙකු වන ප්‍රසන්න මහතා එම ක්ෂේත්‍රය තුළ වසර විස්සකට වැඩි අත්දැකීම් සහ පළපුරුද්ද සහිත යෝගා සහ කායික උපදේශක වරයෙකු, රේකී සුව ශිල්පියෙකු ලෙස ද කටයුතු කරන අතර, හෝටල් කළමණාකරණය පිළිබඳව උපාධිධාරී සූපවේදියෙකු සහ අංක විද්‍යා විද්‍යාර්තීයෙකි.

A Diplomat in Yoga and Anatomy. Mr. Prasanna is also a Yoga and Physical Instructor with more than twenty years of experience in the field. He is also a Reiki Healer and holds a degree in Hotel Management and serves as a Chef in the United Kingdom. He is a Numerologist too.



## ටී.ටී.එස්. හේමාලි මහත්මිය

## Mrs. T.T.S. Hemamali

සහකාර කාර්මික නිලධාරීවරියක ලෙස කලක් ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ සේවය කල හේමාලී මහත්මිය, සිවිල් ඉංජිනේරු විද්‍යාව පිළිබඳව ජාතික තාක්ෂණ සහතිකය සහ භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කැණීම් පිළිබඳ සහතිකපත්‍ර ලාභිනියෙක් ද වේ. හේමාලී මහත්මිය අංක විද්‍යා විද්‍යාර්ථියෙකු ද වේ.

Mrs. Hemali, who worked as an Assistant Technical Officer in the Department of Agricultural Services, holds a National Certificate of Technology in Civil Engineering and a Certificate in Geological Survey and Mining. Mrs. Hemali is also a numerologist.



## මාලි ප්‍රියංගිකා වීරකෝන් මහත්මිය

## Mrs. Maali Priyangika Weerakoon

අංක විද්‍යා විද්‍යාර්ථියකු වන වීරකෝන් මහත්මිය ප්‍රකට සමාජ සේවිකාවක් ද වේ.
Mrs. Weerakoon is a Scholer in Numerology and an active social worker.